# ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

## අධ්‍යාපන නායකත්වය සහ කළමනාකරණය පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහන-2024/2025

## උපදෙස් පොත

අධ්‍යාපන නායකත්ව සහ කළමනාකරණය අධ්‍යයනාංශය

අධ්‍යාපන පීඨය

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

නාවල, නුගේගොඩ

**Telephone: 011-2881231, 011-2881168**

**Fax: 011- 2768055**

**E-Mail : postmast@ou.ac.lk**

**Web: www.ou.ac.lk**

# ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

## අධ්‍යාපන නායකත්වය සහ කළමනාකරණය පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහන 2024/2025

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය 2024/2025 අධ්‍යයන වර්ෂයේ දී අධ්‍යාපන නායකත්වය සහ කළමනාකරණ අධ්‍යයනාංශය ඉදිරිපත් කරනු ලබන **අධ්‍යාපන නායකත්ව සහ කළමනාකරණය පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහන -2024/2025** පිළිබඳ විස්තර මෙම පොත් පිංච මඟින් ඉදිරිපත් කෙරේ.

මෙහි අඩංගු තොරතුරුවල නිවැරදි බව සහතික කරලීම සඳහා සෑම උත්සාහයක්ම ගන්නා අතර ප්‍රතිපත්තිමය හෝ මූල්‍යමය කරුණු හේතු කොට ගෙන ඒවා පසුකාලීනව වෙනස් කිරීම්වලට හෝ සංශෝධනවලට භාජනය විය හැකි ය.

අධ්‍යාපන නායකත්ව සහ කළමනාකරණය අධ්‍යයනාංශය

අධ්‍යාපන පීඨය

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

නාවල

නුගේගොඩ.

# අන්තර්ගතය


| | | |
|---|---|---|
| | | **පිටු අංකය** |
| **පළමු කොටස - සාමාන්‍ය තොරතුරු** | | **1 - 10** |
| 1.0 | ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය | 1 |
| 1.1 | පාඨමාලා හා අධ්‍යයන වැඩසටහන් | 2 |
| 1.2 | ඉගැන්වීමේ ක්‍රම | 8 |
| 1.3 | ඇගයීමේ ක්‍රම | 8 |
| 1.4 | ප්‍රාදේශීය සේවා | 9 |
| 1.5 | වෙනත් සේවා | 10 |
| 1.6 | අධ්‍යයන වැඩසටහන් ගාස්තු | 10 |
| **දෙවන කොටස - අධ්‍යාපන පීඨය** | | **11 - 21** |
| 2.0 | අධ්‍යාපන නායකත්වය සහ කළමනාකරණය පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහන | 11 |
| 2.1 | පරමාර්ථ | 11 |
| 2.2 | ඇතුළත්වීම සඳහා සුදුසුකම් | 11 |
| 2.3 | අධ්‍යයන වැඩසටහනෙහි පාඨමාලා අන්තර්ගතය | 12 |
| 2.4 | දින පාසල් සහ නිබන්ධන සැසි | 13 |
| 2.5 | ඉගැන්වීමේ මාධ්‍යය | 13 |
| 2.6 | ප්‍රාදේශීය/අධ්‍යයන මධ්‍යස්ථාන | 14 |
| 2.7 | ඇගයුම | 14 |
| 2.8 | සහතික ප්‍රදානය | 15 |
| 2.9 | ගාස්තු | 16 |
| 2.10 | අධ්‍යයන වැඩසටහනෙහි ආරම්භය | 17 |
| 2.11 | අයදුම් පත්‍රයේ සටහන | 17 |

## පළමුවන කොටස

### සාමාන්‍ය තොරතුරු

### 1.0 ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතින් ස්ථාපිත කරන ලද ශාස්ත්‍රීය වශයෙන් ස්වයංපාලනයක් සහිත ජාතික විශ්වවිද්‍යාලයකි. ඒ අනුව විවෘත විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාවේ වෙනත් විශ්වවිද්‍යාලවලට හිමි නෛතික හා ශාස්ත්‍රීය තත්ත්වයම දරයි.

වයස අවුරුදු 18 සහ ඊට වැඩි පුද්ගලයින්ට සහතික, ඩිප්ලෝමා, උපාධි සහ පශ්චාත් උපාධි/ඩිප්ලෝමා සඳහා පාඨමාලා හැදෑරීමට හැකි වන පරිදි විවෘත විශ්ව විද්‍යාලයේ අධ්‍යයන වැඩසටහන් සැලසුම් කර ඇත.

විවෘත විශ්වවිද්‍යාලය පූර්ණ කාලීන පදනමින් සේවය කරන කාර්ය මණ්ඩලයක් සහිත මධ්‍යම මණ්ඩපයකින් සමන්විත වේ.

විවෘත විශ්වවිද්‍යාලය ස්වකීය අධ්‍යයන වැඩසටහන් පැවැත්වීම මගින් උපාධි, ඩිප්ලෝමා සහ සහතික ප්‍රදානය කරයි. පූර්ණ කාලීන කාර්ය මණ්ඩලයක් සේවයේ යෙදෙන, සාමාන්‍ය ආකාරයේ මධ්‍යම මණ්ඩපයක් එය සතුව ඇත. ස්වකීය වූ පාලන සභාවක් ද එය සතුව ඇති අතර එය විශ්වවිද්‍යාලයෙහි විධායක සහ ශාස්ත්‍රීය මණ්ඩලය මෙන්ම පාලන අධිකාරිය ද වේ. 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවන ලද විවෘත විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාවේ වෙනත් විශ්වවිද්‍යාලවලට හිමි නෛතික හා ශාස්ත්‍රීය තත්ත්වයම දරයි.

විවෘත විශ්වවිද්‍යාලය එයට බැඳෙන්නා වූ සිසුන්ගේ පක්ෂයෙන් බලන කල, නිවසෙහි සිට අධ්‍යාපනය ලබා දෙන විශ්වවිද්‍යාලයක් මෙන්ම පසු අධ්‍යාපනික අවස්ථා සලසා දෙන විශ්වවිද්‍යාලයක් ද වෙයි. කවර හෙයින් ද යත් පාසල් හැර යාමේ දී අවස්ථාවක් අහිමි වූ හෝ යම් අධ්‍යාපන තත්ත්වයක් ලබා නොගත් තැනැත්තාටත් විවෘත විශ්වවිද්‍යාලය එම අවස්ථාව සලසා දෙන බැවිනි. අනෙකුත් අයට තමන් කලින් ලබා ගත් අවස්ථා හා තත්ත්වයන් වැඩි දියුණු කර ගනිමින් ඒවාට තව තවත් අවස්ථා එක් කර ගැනීමට ද ඉඩ සලසයි. මෙම අවස්ථාවන්ගෙන් නිසි ඵල ලබා ගැනීම සඳහා ඔවුහු වෙහෙසී වැඩ කළ යුතු වෙති.

## 1.1 පාඨමාලා හා අධ්‍යයන වැඩසටහන

විවෘත විශ්වවිද්‍යාලයේ වාග් මාලාවට අනුව පාඨමාලාවක් යන්නෙන් අදහස් කරන්නේ සාමාන්‍යයෙන් එක් අධ්‍යයන වර්ෂයක් තුළ දී සම්පූර්ණ කරනු ලබන මූලික අධ්‍යයන ඒකකයකි. ඒවා අනිවාර්ය හා වෛකල්පික විය හැකි ය.

අනිවාර්ය පාඨමාලා හා වෛකල්පික පාඨමාලා එකතු වී අධ්‍යයන වැඩසටහන් සැකසේ. අධ්‍යයන වැඩසටහනක් සාර්ථක ලෙස හදාරා නිම කිරීම සහතිකයක්, ඩිප්ලෝමාවක් හෝ උපාධියක් ප්‍රදානය කිරීම සඳහා සුදුසුකමක් වේ. අනිවාර්ය පාඨමාලා යනු යම්කිසි අධ්‍යයන වැඩසටහනක ව්‍යූහය තුළ වූ ද කිසියම් වැඩසටහනක අවශ්‍යතා සපුරාලිම සඳහා ශිෂ්‍යයන් විසින් සම්පූර්ණ කළ යුතුම වූද පාඨමාලාවකි. විවෘත විශ්වවිද්‍යාලය සහතිකයක්, ඩිප්ලෝමාවක් හෝ උපාධියක් ලබා දෙන ශාස්ත්‍රීය අධ්‍යයන වැඩසටහන් ඉදිරිපත් කරයි. ඒවා පහත සඳහන් ප්‍රභේද අතුරෙන් එකකට අයත් විය හැකි ය.

1. පදනම් අධ්‍යයන වැඩසටහන්
2. සහතික පත්‍ර අධ්‍යයන වැඩසටහන්
3. උසස් සහතික පත්‍ර අධ්‍යයන වැඩසටහන්
4. ඩිප්ලෝමා අධ්‍යයන වැඩසටහන්
5. ප්‍රථම උපාධි අධ්‍යයන වැඩසටහන්
6. පශ්චාත් උපාධි අධ්‍යයන වැඩසටහන්
7. වැඩිදුර අධ්‍යයන වැඩසටහන්
8. ඒකාංගික වැඩසටහන්

පදනම් අධ්‍යයන වැඩසටහන් සෙසු ශාස්ත්‍රීය අධ්‍යයන වැඩසටහන්වලට ඇතුළු වීමේ දොරටුව වෙයි. මෙම පදනම් අධ්‍යයන වැඩසටහන් මූලික විෂය ක්ෂේත්‍රය තුළ පළමුවන මට්ටම (F1) සහ දෙවන මට්ටම (F2) යනුවෙන් මට්ටම් දෙකකින් පවත්වනු ලැබේ.

කලා, වාණිජ්‍යය, භෞතික විද්‍යාව, ජීව විද්‍යාව, හෝ තාක්ෂණික විද්‍යාව වැනි අධ්‍යයන ක්ෂේත්‍රයක පදනම් අධ්‍යයන වැඩසටහන් සාර්ථක ලෙස සම්පූර්ණ කරන ශිෂ්‍යයා සාම්ප්‍රදායික විශ්වවිද්‍යාලවලට ඇතුළු වීම සඳහා අවශ්‍ය අධ්‍යාපන මට්ටමට සමාන මට්ටමකට එළඹෙයි.

තනි වැඩසටහන් යම් ප්‍රමුඛ අධ්‍යාපන වැඩසටහනකට අයත් නොවන වැඩසටහන් වේ. ඒවා එක් එක් පුද්ගලයාගේ පුද්ගලික අවශ්‍යතා අනුව ස්වාධීනව හැදෑරිය හැකි ය.

වැඩසටහනක **ශාස්ත්‍රීය අගය** දැක්වීම සඳහා විවෘත විශ්වවිද්‍යාලය Credit යන වචනය භාවිත කරයි. යම් විභාගයක දී ශිෂ්‍යයෙක් පෙන්වන දක්ෂතාවය යන්න මෙම වචනයෙන් අදහස් නොවේ. (උදාඃ- අ.පො.ස. සාමාන්‍ය/උසස් පෙළ විභාගවල දී සම්මාන සාමාර්ථය)

කිසියම් පාඨමාලාවක/වැඩසටහනක ශාස්ත්‍රීය අගය 18 යන්නෙන් අදහස් වන්නේ එම පාඨමාලාව/වැඩසටහන සඳහා මිඩංගු කළ යුතු අධ්‍යයන කාලය (සාමාන්‍යයෙන් සතියකට පැය 15ක් පමණ බැගින් සති 30ක් සඳහා) පැය 450 කි. වෙනත් ශාස්ත්‍රීය අගයයන් ඇති පාඨමාලා සඳහා ස්වයං අධ්‍යයන කාලය, ශාස්ත්‍රීය අගය අනුව වෙනස් වේ.

සාමාන්‍ය අධ්‍යයන වැඩසටහනක් හෝ දෙකක් හෝ තුළ අධ්‍යයන වර්ෂයක ශිෂ්‍යයෙකුට ලියාපදිංචි වීමට ඉඩ ලැබෙන්නේ උපරිම වශයෙන් ශාස්ත්‍රීය අගය (credit) 36 ට සමාන අධ්‍යයන වටිනාකමක් ඇති පාඨමාලා සංඛ්‍යාවකට ය. ලියාපදිංචි විය හැකි අවම පාඨමාලා සංඛ්‍යාව ශාස්ත්‍රීය අගය 8 ට සමාන වේ. ශාස්ත්‍රීය අගය 36 ක පාඨමාලාවලට ලියාපදිංචි වී ඇති සිසුන්ට ඊට අමතරව, ශාස්ත්‍රීය අගය 8 ට නොවැඩි අධ්‍යයන වටිනාකමක් ඇති වන සේ වැඩිදුර අධ්‍යයන පාඨමාලාවලට ද ලියාපදිංචි විය හැකි ය.

අක්ෂර හා සංඛ්‍යා හතකින් සමන්විත පාඨමාලා කේතයක් පහත සඳහන් පරිදි එකිනෙක පාඨමාලාවන්ට පවරා ඇත. **(උදා- ELP8401)**

| | | |
|---|---|---|
| පළමු සහ දෙවන අක්ෂරය | - | අධ්‍යයන අංශය (වගුව 1) |
| තුන්වන අක්ෂරය | - | අධ්‍යයන වැඩසටහන (වගුව 2) |
| පළමුවන සංඛ්‍යාංකය | - | වැඩසටහන තුළ අධ්‍යයන මට්ටම |
| දෙවන සංඛ්‍යාංකය | - | ශාස්ත්‍රීය අගය (වගුව 3) |
| අවසාන සංඛ්‍යාංක දෙක | - | පාඨමාලාවේ සුවිශේෂ අනුක්‍රමික අංකය |

**වගුව 1 අධ්‍යයන අංශය**
**විෂයයන් අනුව පාඨමාලා කේත**

| Faculty | Disciplines of Study | Course codes |
|---|---|---|
| Education | Secondary & Tertiary Education | ST |
| | Early Childhood | EC |
| | Special Needs Education | SN |
| | Educational Leadership | EL |
| Natural Sciences | Computer Science | CS |
| | Botany | BY |
| | Chemistry | CY |
| | Physics | PH |
| | Zoology | ZY |
| | Mathematics | PE |
| Engineering Technology | Civil Engineering | CV |
| | Agricultural and Plantation Engineering | AG |
| | Electrical and Computer Engineering | EE |
| | Mathematics and Philosophy of Engineering | MH |
| | Mechanical Engineering | DM |
| | Textile and Apparel Technology | TA |
| Humanities and Social Sciences | Language Studies | LS |
| | Legal Studies | LL |
| | English Language Teaching | LL |
| | Social Studies | DS |
| Health Science | Nursing | NG |
| | Medical Laboratory Sciences | MD |
| | Pharmacy | FM |
| | Basic Sciences | BS |
| | Psychology and Counselling | PL |
| | Health Education and Research | HE |
| Management Studies | Organizational Studies | OS |
| | Accounting and Finance | AF |
| | Human Resource Management | HR |
| | Marketing Management | MM |

**වගුව 2 - ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව ( SLQF) 2015 ට අනුව පාඨමාලා මට්ටම**

| SLQF මට්ටම | පිරිනමනු ලබන සුදුසුකම (Qualification Awarded) |
|---|---|
| 12 | දර්ශන ශූරි (Doctor of Philosophy) |
| 11 | දර්ශනපති (Master of Philosophy) |
| 10 | ශාස්ත්‍රපති (Masters with course work and a research component) |
| 09 | ශාස්ත්‍රපති (Masters by course work) |
| **08** | **පශ්චාත් උපාධි ඩිප්ලෝමා (Postgraduate Diploma)** |
| 07 | පශ්චාත් උපාධි සහතිකපත්‍ර (Postgraduate Certificate) |
| 06 | ගෞරව උපාධි (Bachelors Honours) |
| 05 | උපාධි (Bachelors) |
| 04 | උසස් ඩිප්ලෝමා (Higher Diploma) |
| 03 | ඩිප්ලෝමා (Diploma) |
| 02 | උසස් සහතිකපත්‍ර (GCE A/L or equivalent) |
| 01 | සහතිකපත්‍ර( (GCE O/L or equivalent) |

**වගුව 3 - ශාස්ත්‍රීය අගය**

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ක්ෂේත්‍රයේ දෙවන සංඛ්‍යාංකය | 8 | 7 | 6 | 5 | 4 | 3 | 2 | 1 | 0 |
| ශාස්ත්‍රීය අගය | 8 | 7 | 6 | 5 | 4 | 3 | 2 | 1 | 0 |

### 1.2 ඉගැන්වීමේ ක්‍රම

මෙය බහු මාධ්‍ය මත පදනම් වී ඇත.

#### (1) *මාර්ගගත ඉගෙනුම*

මෙම වැඩසටහනට අදාළ සියලුම පාඨමාලා සඳහා මාර්ගගත පාඨමාලා Moodle – OULMS හි සංවර්ධනය කර ඇත. ඔබට ලැබෙන පරිශීලක නාමය (Username) සහ රහස්‍ය පදය (Password) භාවිත කර එම පාඨමාලා සඳහා ඇතුළත් (Login) විය හැකිය. එම පාඨමාලාවන්ට අදාළ සියලුම අත්‍යවශ්‍ය ඉගෙනුම් ද්‍රව්‍ය, අතිරේක කියවීම්, නිවේදන මෙන්ම ක්‍රියාකාරකම් ද එම මාර්ගගත පාඨමාලාවලට නිරන්තරයෙන් ඇතුළත්වීම් මඟින් ඔබට දැනගත හැකි වනු ඇත. මෙම මාර්ගගත පාඨමාලා පරිශීලනය කරමින් ඔබ ස්වයං අධ්‍යයනයේ යෙදීම අපේක්ෂා කරනු ලැබේ.

### (2) *ශ්‍රව්‍ය දෘශ්‍යාධාර*

මුද්‍රිත පාඩම්වලට අමතරව ශ්‍රව්‍ය දෘශ්‍යාධාර යොදා ගැනීමට විවෘත විශ්වවිද්‍යාලය හැකිතාක් දුරට උත්සාහ කරයි. ස්වයං අධ්‍යයනයෙහි යෙදෙන ශිෂ්‍යයාට මේවා විශේෂයෙන් වැදගත් වේ.

සිසුන්ට සපයන ශ්‍රව්‍ය පටිවලට අමතරව සෑම ප්‍රාදේශීය මධ්‍යස්ථානයකම පාඨමාලාවලට අදාළ ශ්‍රව්‍ය පට නැරඹීමේ/ශ්‍රවණය කිරීමේ පහසුකම් ඇත. විශේෂයෙන් ම නාවල ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ ඒ සඳහා ශ්‍රව්‍ය දෘශ්‍ය මධ්‍යස්ථානයක් විවෘත කර ඇත. සතියේ දිනවල දී සහ සති අන්තවල දී උදේ 9.00 සිට සවස 7.00 දක්වා එය විවෘතව ඇති අතර, සිසුන්ට තම තමන්ගේ පාඨමාලාවලට අදාළ ශ්‍රව්‍ය දෘශ්‍ය පටි නැරඹීමට/ශ්‍රවණය කිරීමට එහි පහසුකම් සපයා ඇත.

### (3) *දින පාසල් හා උපදේශන සේවා*

ශිෂ්‍යයන්ට ස්වාධීනව ඉගෙන ගැනීම සඳහා මුද්‍රිත පාඩම් හා ශ්‍රව්‍ය දෘශ්‍යාධාර සැලසුම් කොට ඇතත්, ඊට අමතරව දින පාසල් හා නිබන්ධන සැසි මගින් උපදෙස් ලබා දීම විවෘත විශ්වවිද්‍යාලයේ ප්‍රාදේශීය හා අධ්‍යයන මධ්‍යස්ථානවලදී සිදු කෙරෙනු ඇත.

### (4) *පුස්තකාල පහසුකම්*

සියලුම ප්‍රාදේශීය හා අධ්‍යයන මධ්‍යස්ථානවල පුස්තකාල පහසුකම් සෑහෙන ප්‍රමාණයකට ඇත. නාවල පිහිටි පුස්තකාලය සිසුන් සඳහා සතියේ දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 7.00 දක්වා විවෘතව ඇත. රජයේ නිවාඩු දිනවල සහ සති අන්තයේ දී පෙ.ව. 9.00 සිට ප.ව. 6.00 දක්වා විවෘත ව ඇත.

## 1.3 ඇගයීම් ක්‍රම

ශිෂ්‍යයන්ගේ ඉගෙනීම අඛණ්ඩ ඇගයීම් (ලිඛිත පැවරුම්, අඛණ්ඩ තක්සේරුකරණ පරීක්ෂණ (CAT) සහ ක්‍රියාකාරකම් පාදක දිනපාසල්) සහ අවසානයේ දි ලිඛිත විභාගයකින්ද අගයනු ලැබේ. සෑම පාඨමාලාවක් සඳහා ම සිසුන් නියමිත පැවරුම් සංඛ්‍යාවක් සම්පූර්ණ කළ යුතු ය. මෙම පැවරුම් උපදේශකවරුන්ගේ ගුණදොස් විවේචන හා අදාළ ශ්‍රේණි ද සහිතව නැවත සිසුන්ට භාර දෙනු ලැබේ. විවෘත විශ්වවිද්‍යාලයේ ඇගයීම් පද්ධතියෙහි ඉතාමත් වැදගත් කොටසක් ලෙස සලකන මෙම පැවරුම් ඒ ඒ පාඨමාලාව අනුව විවිධ ස්වරූපයක් ගනු ඇත. නිදසුන් ඃ විද්‍යාගාර වැඩ, ලිඛිත පැවරුම්, ප්‍රායෝගික ක්‍රියාකාරකම් ආදිය. එක් එක් පාඨමාලාවට නියමිත අඛණ්ඩ ඇගයීම් පටිපාටිය පාඨමාලාව ආරම්භයේ දී සිසුන්ට ද දන්වනු ඇත.

පැවරුම් සාර්ථක ලෙස නිම කිරීමෙන් පසු අවසාන විභාගයට පෙනී සිටීමට ශිෂ්‍යයාට හැකි වේ. කිසියම් පාඨමාලාවක අවසාන විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබන සිසුන් එම පාඨමාලාව සඳහා නැවත ලියාපදිංචි විය යුතු ය.

අවසාන විභාගය අසමත් වන සිසුන් නැවත විභාගයට පෙනී සිටිය යුතු ය. එහෙත් එම පාඨමාලාවන් සඳහා නැවත පැවරුම් ඉදිරිපත් කළ යුතු නොවේ.

## 1.4 ප්‍රාදේශීය සේවා

ශිෂ්‍යයන්ට ඔවුනොවුන් හමු වී සාකච්ඡා පැවැත්වීම සඳහාත් පන්ති කාමර ඉගැන්වීම සඳහාත් පහසුකම් සැලසීමට විවෘත විශ්වවිද්‍යාලය මගින් දිවයින පුරා ප්‍රාදේශීය හා අධ්‍යයන මධ්‍යස්ථාන පිහිටුවා ඇත. දැනට විවෘත විශ්වවිද්‍යාලයේ ප්‍රාදේශීය/අධ්‍යයන මධ්‍යස්ථාන පිහිටුවා ඇත්තේ මෙහි දක්වා ඇති ස්ථානවල ය.

### ප්‍රාදේශීය මධ්‍යස්ථාන

| | | | |
|---|---|---|---|
| WP10 | කොළඹ | NP40 | යාපනය |
| CP20 | මහනුවර | NC50 | අනුරාධපුරය |
| SP30 | මාතර | EP60 | මඩකලපුව |
| NW70 | කුරුණෑගල | UP80 | බදුල්ල |
| SG90 | රත්නපුරය | | |

### අධ්‍යයන මධ්‍යස්ථාන

| | | | |
|---|---|---|---|
| WP11 | ගම්පහ | SG91 | කෑගල්ල |
| WP12 | කළුතර | NW71 | පුත්තලම |
| CP21 | හැටන් | | නාත්තන්ඩිය |
| SP31 | අම්බලන්ගොඩ | NP41 | වව්නියාව |
| SP32 | ගාල්ල | NP42 | කිලිනොච්චිය |
| SP33 | අම්බලන්තොට | EP61 | අම්පාර |
| UP81 | බණ්ඩාරවෙල | EP62 | ත්‍රිකුණාමලය |
| UP82 | මොණරාගල | NP43 | මුලතිව් |
| NC51 | පොලොන්නරුව | MP44 | මන්නාරම |
| | | | මාතලේ |

සම්පූර්ණ කළ පැවරුම් භාර ගැනීම මෙම මධ්‍යස්ථානවල දී සිදු කෙරේ. කොළඹ, මහනුවර සහ මාතර මධ්‍යස්ථානවල විද්‍යාගාර පහසුකම් ද ඇත.

කෙසේ වුවද පන්ති කාමර ඉගැන්වීම සඳහා අධ්‍යයන මධ්‍යස්ථානයක් ප්‍රයෝජනයට ගැනීම, ප්‍රමාණවත් ශිෂ්‍ය සංඛ්‍යාවක් විසින් එම මධ්‍යස්ථාන තෝරා ගැනීම සහ ආචාර්ය මහත්ම මහත්මීන් ලබා ගැනීමේ පහසුව මත රැඳෙන බව සැළකිය යුතුය.

**1.5 වෙනත් සේවා**

*(1) ආපන ශාලා පහසුකම්*

විශ්වවිද්‍යාල ආපන ශාලාවෙන් සතියේ දිනවල හා සති අන්තවල දී සාධාරණ මිලකට ආහාර ලබා ගත හැකි ය. මහනුවර හා මාතර මධ්‍යස්ථානවල ද ආපනශාලා පහසුකම් ඇත.

**1.6 අධ්‍යයන වැඩසටහන් ගාස්තු**

අධ්‍යයන වැඩසටහනකට ලියාපදංචි වීමේ දී හා ගාස්තු ගෙවීමට නියමිත අවස්ථාවල දී ඒවා අප්‍රමාදව ගෙවිය යුතු ය. පූර්ව දැනුම් දීමකින් තොරව ඕනෑම අවස්ථාවක ගාස්තු සංශෝධනය කිරීමේ බලය විශ්වවිද්‍යාලය සතු ය. එක් එක් අධ්‍යයන වැඩසටහන අනුව ගාස්තු වෙනස් වන අතර **2.9** අංකය යටතේ අධ්‍යාපන නායකත්ව සහ කළමනාකරණය පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහනෙහි ගාස්තු පිළිබඳ විස්තර ඇතුළත් කර ඇත.

## දෙවන කොටස

**අධ්‍යාපන පීඨය**

අධ්‍යාපන පීඨය අධ්‍යයනාංශ හතරකින් සමන්විතය.

1. **අධ්‍යාපන නායකත්වය සහ කළමනාකරණ අධ්‍යයනාංශය**
2. ද්විතීයික හා තෘතියික අධ්‍යාපන අධ්‍යයනාංශය
3. ප්‍රාථමික හා මුල් ළමාවිය අධ්‍යයනාංශය
4. විශේෂ අවශ්‍යතා අධ්‍යාපන අධ්‍යයනාංශය

අධ්‍යාපන නායකත්ව සහ කළමනාකරණ අධ්‍යයනාංශය මගින් ඉදිරිපත් කරන අධ්‍යයන වැඩසටහන් තුනකි.

- **අධ්‍යාපන නායකත්ව සහ කළමනාකරණය පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහන**
- පාසල් කළමනාකරණ පිළිබඳ කෙටි පාඨමාලාව (Online)
- ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය සඳහා පැය 100 ක ධාරිතා සංව¾ධන වැඩසටහන (Online)

**2.0 අධ්‍යාපන නායතක්වය හා කළමනාකරණය පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහන**

මෙය මාස 12 ක අධ්‍යයන වැඩසටහනකි.

## 2.1 පරමාර්ථ

මෙම අධ්‍යයන වැඩසටහනෙහි මූලික පරමාර්ථය වන්නේ අධ්‍යාපන ක්‍ෂේත්‍රයේ සිටින අධ්‍යාපන කළමනාකරුවන්ගේ සහා අධ්‍යාපන වෘතිකයින්ගේ අධ්‍යාපන නායකත්ව හා කළමනාකරණ නිපුණතා සහ ව්‍යවහාරයන් වැඩි දියුණු කිරීම තුළින් අධ්‍යාපන නායකත්ව හා කළමනාකරණ ක්ෂේත්‍රයේ කාර්‍යක්ෂමතාව හා ඵළදායිතාව ඉහළ නංවීමයි.

## 2.2 ඇතුළත්වීම සඳහා සුදුසුකම්

1. පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් අවම වශයෙන් අවුරුදු **තුනක (03)** ප්‍රථම උපාධියක් හෝ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ සනාතන සභාව පිළිගත් ඊට සමාන සුදුසුකම් ලබා තිබීම,

**සහ**

2. රජයේ හෝ පෞද්ගලික පාසලක සේවයේ නියුතු ගුරුවරයකු **හෝ** විදුහල්පතිවරයකු **හෝ** ගුරු උපදේශකවරයකු වීම **හෝ** ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ (SLTES) **හෝ** ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ (SLEAS) **හෝ** ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ (SLPS) **හෝ** නිළධාරියකු වීම **හෝ** විශ්වවිද්‍යාල, කාර්මික විද්‍යාල, ගුරු විද්‍යාලවල පූර්ණකාලීන අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයකු වීම **හෝ** ගුරු මධ්‍යස්ථාන කළමනාකරුවකු වීම **හෝ** ජාතික අධ්‍යාපන ආයතනයේ කථිකාචාර්යවරයකු වීම **හෝ** ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ සනාතන සභාව පිළිගණු ලබන අධ්‍යාපන ආයතනයක ප්‍රධානියෙකු වීම **හෝ** අධ්‍යාපන කළමනාකරණ හා පරිපාලන ක්ෂේත්‍රයේ වෙනත් ඕනෑම වෘත්තිකයකු වීම.

3. ඔබගේ උපාධිය ශ්‍රී ලංකාවේ පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගත් එකක් නොවේ නම් හෝ එය මාර්ගගතව (Online) ලබාගත් උපාධියක් නම් එම උපාධිය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් බව සනාථ කළ යුතුය.(විදේශ උපාධි සඳහා අවම වශයෙන් වසර තුනක (3) කාලපරිච්ඡේදය සනාථ කළ යුතුය.)

- සුදුසුකම්ලත් අයදුම්කරුවන් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන පීඨයේ, අදාළ අධ්‍යයනාංශය මගින් පවත්වනු ලබන තෝරා ගැනීමේ සම්මුඛ පරීක්‍ෂණය සඳහා පෙනී සිටිය යුතුය.
- තෝරා ගැනීමේ සම්මුඛ පරීක්‍ෂණයෙන් සුදුසුකම් ලැබූවන්ගේ ලේඛනය විශ්වවිද්‍යාල වෙබ් අඩවිය වන www.ou.ac.lk හි පළ කරනු ඇත.
- වැඩසටහන සඳහා සුදුසුකම් ලැබූවන් ලියාපදිංචි කිරීම තෝරා ගැනීමේ සම්මුඛ පරීක්‍ෂණයෙන් පසුව සිදු කරනු ලැබේ.
- සියලු ලියාපදිංචි සිසුන් සමාරම්භක සැසියට සහභාගි වීම අනිවාර්ය වේ.

## 2.3 අධ්‍යයන වැඩසටහනෙහි පාඨමාලා අන්තර්ගතය

අනිවාර්ය පාඨමාලා (06) සහ විකල්ප පාඨමාලා (04)

| | | | |
|---|---|---|---|
| අදියර 1 | **අනිවාර්ය පාඨමාලා** | | |
| | | ELP8401 | අධ්‍යාපනික කළමනාකරණය සහ පරිපාලනය |
| | | ELP8302 | අධ්‍යාපනික සන්දර්භය තුළ සංවිධානාත්මක චර්යාව |
| | | ELP8503 | අධ්‍යාපනික නායකත්වය |
| | **විකල්ප පාඨමාලා (මෙයින් එකක් පමණක් තෝරාගත යුතුය)** | | |
| | | ELP8304 | අධ්‍යාපනික සම්පත් කළමනාකරණය |
| | | ELP8309 | විෂයමාලා කළමනාකරණය |
| | | | |
| අදියර 2 | **අනිවාර්ය පාඨමාලා** | | |
| | | ELP8505 | අධ්‍යාපනික නායකත්වය සහ ඵලදායී සංවිධාන |
| | | ELP8306 | අධ්‍යාපන සංවිධානවල නියාමනය සහ අධීක්ෂණය |
| | | ELP8508 | ස්වාධීන අධ්‍යයනය |
| | **විකල්ප පාඨමාලා (මෙයින් එකක් පමණක් තෝරාගත යුතුය)** | | |
| | | ELP8307 | අධ්‍යාපනික ප්‍රතිපත්ති සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය |
| | | ELP8310 | ව්‍යාපෘති කළමනාකරණය |

**සැයු :** ස්වාධීන අධ්‍යයනය (ELP8508) සියුල්ම සිසුන්ට අනිවාර්ය පාඨමාලාවක් වන අතර, එය විශේෂයෙන් පිරිනමුණු ලබන්නේ අධ්‍යාපන නායකත්ව සහ කළමනාකරණ ක්ෂේත්‍රයේ තෝරාගත් කුඩා පරිමාණ පර්යේෂණ ව්‍යාපෘතියක් සිදු කිරීම සඳහා ශිෂ්‍යයාට අවැසි පර්යේෂණ දැනුම, කුසලතා සහ භාවිතයන් වර්ධනය කිරීමට ය.

## 2.4 දින පාසල් හා ශිෂ්‍ය උපදේශන සැසි

දැනුම ලබා දීමේ ප්‍රධාන ක්‍රමය Moodle - OULMS හි සංවර්ධනය කර ඇති මාර්ගගත පාඨමාලා වේ. මෙම මාර්ගගත පාඨමාලා වලට අමතරව ශ්‍රව්‍ය දෘශ්‍ය පට භාවිතයට ද කටයුතු සලසා ඇත. සාකච්ඡා, කාර්ය සැසි, ක්‍රියාකාරකම් පාදක ස්වරූපයෙන් පවත්වනු ලබන මෙම දින පාසල්වල දී මුද්‍රිත පාඩම් යාවත්කාලීන කිරීමට හා සිසුන්ගේ අධ්‍යයන ගැටලු සාකච්ඡා කිරීමටත් අපේක්ෂා කෙරේ.

දින පාසල්වලට අමතරව කුඩා කණ්ඩායම් වශයෙන් සංවිධානය කරනු ලබන උපදේශන සැසි සඳහා පැය 36 කට ආසන්න කාලයක් වෙන් කර ඇත. මෙම උපදේශන සැසිවල දී සිසුන්ගේ ඉගෙනීම් කටයුතු සම්බන්ධ ගැටලු, පැවරුම් සම්බන්ධ ගැටලු හා වෙනත් අදාළ ගැටලු සාකච්ඡා කිරීමටත්, ඔවුන් විභාග සඳහා යොමු කිරීමටත් අපේක්ෂිතය.

## 2.5 ඉගැන්වීමේ මාධ්‍යය

මෙම වැඩසටහන සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පවත්වනු ලැබේ.

## 2.6 ප්‍රාදේශීය/ අධ්‍යයන මධ්‍යස්ථාන

**අධ්‍යාපන නායකත්ව හා කළමනාකරණය පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහන-2024/2025 පවත්වනු ලබන්නේ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ කොළඹ ප්‍රාදේශිය මධ්‍යස්ථානයේ පමණි.**

## 2.7 ඇගයුම

ඇගයුම කරනු ලබන්නේ පහත සඳහන් ක්‍රම මගිනි.

**(අ) නියම කරන ලද අනිවාර්ය ලිඛිත පැවරුම් මගින් සිදු කරන අඛණ්ඩ ඇගයුම්**

මේවා නියමිත දිනට සම්පූර්ණ කොට භාර දිය යුතුය. ශාස්ත්‍රීය අගය 5ක් හෝ 4ක් වන සෑම පාඨමාලාවක් සඳහාම අඛණ්ඩ තක්සේරුකරණ තුනක් (3) අන්තර්ගත වේ (ELP8508 හැර). ශාස්ත්‍රීය අගය 3 ක් වන සෑම පාඨමාලාවකම යෝග්‍යතාව ලබා ගැනීම සඳහා තක්සේරුකරණ දෙකක් (2) සම්පූර්ණ කිරීම අනිවාර්ය වේ. අවසාන පරීක්ෂණය (ලිඛිත විභාගය) සඳහා යෝග්‍යතාව ලැබීමට නියමිත අඛණ්ඩ තක්සේරුකරණ සම්පූර්ණ කිරීම අනිවාර්ය වේ. ඒ අනුව සමස්ත අඛණ්ඩ තක්සේරුකරණ ලකුණ හෙවත් තක්සේරුකරණවල මුළු ලකුණුවල සාමාන්‍ය (OCAM) ලකුණු 40 ක් හෝ ඊට ඉහළ ලකුණක් වීම අත්‍යවශ්‍ය වේ.

කිසියම් පාඨමාලාවක් සඳහා නියමිත අවසාන ශ්‍රේණිය තිරණය කිරීමේ දි අඛණ්ඩ තක්සේරුකරණ ලකුණු වලින් 40% ක් ද, අවසාන පරික්ෂණයේ ලකුණුවලින් 60% ක් ද යොදා ගනු ලැබේ.

***සැලකිය යුතුයි**

යම්කිසි අවස්ථාවකදි කිසියම් පාඨමාලවක අවසාන පරික්ෂණය සඳහා යම් අපේක්ෂකයෙක් අවම වශයෙන් ලකුණු 40 ක් ලබා ගැනීමට අපොහොසත් වුව හොත් එම පාඨමාලාවට අදාළ සමස්ත අඛණ්ඩ ඇගයීම් ලකුණ (OCAM) එකතු නොවේ.

**(ආ) අවසාන ලිඛිත පරීක්ෂණය මගින් සිදු කෙරෙන ඇගයුම**

**අවසාන ලිඛිත පරීක්ෂණය මගින් සිදු කෙරෙන ඇගයුම**

උක්ත අධ්‍යයන වැඩසටහනට අදාළ අවසාන ලිඛිත පරීක්ෂණය අදියර දෙකක් (2) යටතේ පැවැත් වේ.

**අදියර-I** ELP8401, ELP8302, ELP8503, ELP8304, ELP8309

**අදියර-II** ELP8505, ELP8306, ELP8307, ELP8310

**සැයු:** ELP8508 (**ස්වාධීන අධ්‍යයනය**) පාඨමාලාව සඳහා අවසාන ලිඛිත විභාගයක් පවත්වනු නොලැබේ. කෙසේ වෙතත් සිසුන් මෙම පාඨමාලවට අදාළ කුඩා පරිමාණ පර්යේෂණ ව්‍යාපෘතිය

සම්පූර්ණ කළ යුතුය. ඒ අනුව ඔබ ඉදිරිපත් කරනු ලබන පර්යේෂණ වාර්තාව මෙම පාඨමාලාවට අදාළ අවසාන ලිඛිත පරීක්ෂණය ලෙස සළකණු ලැබේ.

**අධ්‍යයන වැඩසටහන ට අදාළ අවසන් ලිඛිත පරික්ෂණ අධ්‍යයන වර්ෂයේ එක් එක් අදියර අවසානයේ පවත්වනු ලැබේ.**

## 2.8 සහතිකපත්‍ර ප්‍රධානය

අධ්‍යාපන නායකත්ව හා කළමනාකරණ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ නීති හා රෙගුලාසි අනුව සිදු කරනු ලැබේ.

## 2.9 ගාස්තු

| | |
|---|---|
| ලියාපදිංචි කිරීෙ ගාස්තු | රු 1,500.00 |
| පහසුකා ගාස්තු | රු 2,500.00 |
| පුස්තකාල පහසුකම් ගාස්තු | රු 200.00 |
| ශිෂ්‍ය උපදේශන ගාස්තු Credit 1 සඳහා ;මුළු Credit ගණන 31) | රු 3,000.00 |
| සමස්ත උපදේශන ගාස්තුව (31 x 3,000) | රු 93,000.00 |

විදේශ ශිෂ්‍යයන් සඳහා ගාස්තු අය කිරීම් පහත පරිදි වේ.

ලියාපදිංචි කිරීමේ ගාස්තු ඇ.ඩොලර් 100 (එක් වර්ෂයක් සඳහා)

සංවර්ධිත රටවල් සඳහා ඇ.ඩොලර් 50 (Credit එකක් සඳහා)

සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා ඇ.ඩොලර් 25 (Credit එකක් සඳහා)

ශිෂ්‍යයින් විසින් අදාළ ගෙවීම් වාරික දෙකකින් සිදු කළ යුතු ය. ලියාපදිංචි වීමේ දී සම්පූර්ණ ගාස්තුවෙන් 60% ක් ගෙවිය යුතු අතර ඉතිරි 40% අධ්‍යයන වැඩසටහන අතරතුර දී ගෙවිය යුතු ය. විභාග අසමත් වන ශිෂ්‍යයින්ට නැවත ලියාපදිංචි වීමේ දී නැවත අධ්‍යයනය කිරීමට සිදු වන පාඨමාලා අනුව ගාස්තු ගෙවීමට සිදුවනු ඇත.

**අධ්‍යයන වැඩසටහන/පාඨමාලා වෙනස් කිරීම**

ලියාපදිංචි වී ඇති සම්පූර්ණ අධ්‍යයන වැඩසටහන කල් දැමීමට අවසර දෙනු නොලැබේ. පාඨමාලා කල් දැමීමට අදහස් කරන අයදුම්කරුවන් අවම වශයෙන් ශාස්ත්‍රීය අගය 5 ක් වන පාඨමාලා සඳහා ලියාපදිංචිය අනිවාර්යයෙන්ම රඳවා ගත යුතු ය. පාඨමාලා කල් දැමිය හැකි කාල සීමාව වැඩසටහන ආරම්භ වී මාස 2 කින් අවසන් වේ. කුමන හේතුවක් නිසා හෝ මෙම දිනය දීර්ඝ කරනු නොලැබේ. නැවත ලියාපදිංචි වීමේ දී පළමු අවස්ථාවට වඩා වැඩි ගාස්තුවක් ගෙවීමට සිදු වනු ඇත.

**ලියාපදිංචි වූ වෛකල්පික පාඨමාලා වෙනස්කර ගැනීම/අවලංගු කර ගැනීම**

අයදුම්කරුවන් ලියාපදිංචි වන වෛකල්පික පාඨමාලා මාරු කිරීමේ කාලසීමාව වැඩසටහන ආරම්භ වී මාස 2 කින් අවසන් වේ. කුමන හේතුවක් නිසා හෝ මෙම දිනය වෙනස් කරනු නොලැබේ.

**ලියාපදිංචි වූ අධ්‍යයන වැඩසටහනින් ඉවත් වීම**

අධ්‍යයන වැඩසටහනට ලියාපදිංචි වීමෙන් පසුව මසක් ඉකුත්වීමට පෙර 10% ක ගාස්තුවකට යටත්ව ලියාපදිංචි වූ අධ්‍යයන වැඩසටහනෙන් ඉවත් විය හැකිය. කුමන හේතුවක් නිසා හෝ මෙම දිනය වෙනස් කරනු නොලැබේ.

**__**සැලකිය යුතුයි__**

විශ්වවිද්‍යාලය විසින් ලියාපදිංචි වීම/නැවත ලියාපදිංචි වීම සඳහා පැමිණිය යුතු බවට දන්වා එවන දිනයන්ට පසුව ලියාපදිංචි වීමේ කටයුතු කරනු නොලැබේ.

**අධ්‍යයන වැඩසටහනට ලියාපදිංචි වූ පසු ඔබගේ ශිෂ්‍යභාවය පවත්වාගත හැක්කේ හැක්කේ ලියාපදිංචි වූ අධ්‍යයන වර්ෂය ඇතුළත්ව අඛණ්ඩ අධ්‍යයන වර්ෂ හතරක් (4) ක් පමණක් වන අතර, අඛණ්ඩ ඇගයීම්වල යෝග්‍යතාව පවත්වාගත හැකි වන්නේ ලියාපදිංචි වූ අධ්‍යයන වර්ෂය හැර තවත් එක් (1) අධ්‍යයන වර්ෂයක් පමණි.**

**2.10 අධ්‍යයන වැඩසටහනෙහි ආරම්භය**

පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා වැඩසටහනේ අධ්‍යයන කටයුතු සමාරම්භක සැසිය අවසන් වූ සැනින් ආරම්භ කිරීමට නියමිතය.

**රාජකාරී හෝ අධ්‍යයන නිවාඩු අනුමත කර ගැනීම සඳහා යා් අවශ්‍යතාවක් පැන නගින්නේ යැයි ඔබ සිතන්නේනා් ඔබ සේවය කරන ආයතනයේ අයතන ප්‍රධානියා විසින් ඔබගේ අධ්‍යාපන නායකත්ව හා කළමනාකරණ පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහන සඳහා වන අයදුම් පත්‍රය අනුමත කරවාගෙන එහි ඡායා පිටපතක් ඔබ ලඟ තබා ගැනීම සහ එහි එක් ඡායා පිටපතක් අදාළ ආයතනයේ/කාර්යාලයේ ඔබගේ ලිපි ගොනුවට යැවීමට ද කටයුතු කිරීම ප්‍රයෝජනවත් වනු ඇත. පසුව ඉල්ලුම් පත්‍රයේ පිටපත් ලබා දෙන ලෙස ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයට කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.**

**2.11 අයදුම්පත්‍රය ලබාගැනීම**

අයදුම්පත් යොමු කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට පමණක් වන් අතර පහත සම්බන්ධකය (Link) ඔස්සේ අයදුම්පත් යොමු කළ හැකිය.


https://www.ou.ac.lk/applyonline







c) Sample online application form




d) Online page for selecting the payment method

